# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2494/17 - 2026 ජූනි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2026.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත ඒකක 162කින් සමන්විත නේවාසික මහල් නිවාස ගොඩනැගිල්ල හා නේවාසික විලා නිවාස 06 කින් සමන්විත ව්‍යාපෘතිය
අංක 414/1, දොඩන්දූව පාර, ක්‍රාවේගොඩ, හික්කඩුව

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව, කොළඹ 01, එලිජසන් චතුරශ්‍රය, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුළුණ, අංක 18-01 දරන ලිපිනයේ මිරේකා සී ස්කේප් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද, හික්කඩුව ක්‍රාවේගොඩ, දොඩන්දූව පාර, අංක 414//1 දරන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත ඒකක 162 කින් සමන්විත නේවාසික මහල් නිවාස ගොඩනැගිල්ල හා නේවාසික විලා නිවාස 06කින් සමන්විත ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2026.06.25 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත:

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10,
02. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල,
03. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල,
04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හික්කඩුව,
05. නගර සභාව, හික්කඩුව,
06. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල,


1A - G 47107 — 23 (2026/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

07. මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල,

08. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, ගාල්ල,

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2026.06.25 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

මහාචාර්ය **පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011 - 2449754, 011 - 2387922, 011 - 2449197,
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 06 - 0282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.